කැලණිය අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2016

සිංහල භාෂාව හා සාහිත්‍යය I පත්‍රය

11 වන ශ්‍රේණිය | කාලය පැය 01 යි

සැලකිය යුතු යි

(i) **සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න.** මෙම ප්‍රශ්න පත්‍රය සඳහා **ලකුණු 40ක්** ලැබේ.

(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1) (2) (3) (4) උත්තරවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** උත්තරය තෝරන්න.

(iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

- අංක 1 සිට 3 තෙක් ඇති ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි **තද කළු අකුරින්** මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වචනය තෝරන්න.

1. අපිත් ඉර හඳ **දුටු මිනිස්සු** වෙමු.

    1. හිරු හා චන්ද්‍රයා ගැන හොඳින් දන්නා.
    2. දිවා රෑ වෙහෙස වී වැඩ කරන.
    3. යමක් කමක් දන්නා.
    4. ලෝකය ගැන දන්නා.

2. මම **දහසකුත් එකක්** බලාපොරොත්තු අතර අතරමං වීමි.

    1. අධික
    2. දහසක් පමණ
    3. දහසකින් එකක්
    4. එක් දහස් එකක්

3. '' එවුන්ට දැන් **අං ඇවිල්ලා** ඒකයි අපව පෙනෙන්නේ නැත්තේ'' යනුවෙන් ආච්චි අම්මා කියාගෙන ගියා ය.

    1. චණ්ඩි වෙලා
    2. මෝඩ වෙලා
    3. ආඩම්බරයට පත් වෙලා.
    4. තරහ වෙලා

- අංක 4 සිට 6 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

4. ලෙනාඩ් වුල්ෆ් නම් ඉංග්‍රීසි ජාතික ලේඛකයාට බැද්දේගම ජන ජීවිතය පිළිබඳ ........ දැනුමක් තිබිණි.

    1. පතළ 2. ප්‍රකට 3. විපුල 4. හසළ

5. පුරාණයේ වැවෙන් ........ ගම්මානය ස්වයංපෝෂිත එකක් විය.

    1. පරිපෝෂිත වූ 2. සකස් වූ 3. බිහි වූ 4. ආරම්භ වූ

6. ඉල්ලුමට සාපේක්ෂ ව ජල විදුලිය ........... කිරීම ශ්‍රී ලංකාවට තවමත් ගැටලුවකි.

    1. සැපයුම් 2. ජනනය 3. උත්පාදනය 4. නිෂ්පාදනය

7. අකාරාදී පිළිවෙළ නිවැරදි ව යෙදී ඇති පද පෙළිය තෝරන්න.
   1. ඉරාණය, එංගලන්තය, ඕස්ට්‍රියාව, ඕස්ට්‍රේලියාව
   2. අංකය, අල්ගම, ආගම, ඈනුම
   3. ගගන, ගිහාන්, ගීතලාල්, ගීතාංජන
   4. වස්තුව, විස්මිත, විලාසිතාව, විශ්වය

8. සෑම පදයකම ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පෙළිය තෝරන්න.
   1. අත්‍යවශ්‍ය, ප්‍රාසාංගික, සාමාර්ථ්‍යය, විද්‍යමාන
   2. තුෂ්ණිම්භූත, මූල්‍ය, විද්‍යාමාන, ධූරය
   3. ව්‍යංගාර්ථ, ගෘහස්ත, කල්‍යාණ, ඓක්‍යය
   4. ව්‍යංග්‍යාර්ථ, ප්‍රකූර්ති, රිද්මානුකූල, විශිෂ්ට

9. අව්‍ය සමාසයට උදාහරණයක් වන්නේ,
   1. කුරුළු ගී   2. සුලලිත   3. තුරුලතා   4. තාරපති

10. උක්ත නාම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
   1. අප, අම්බරුවෝ, සෙබළු, නළුවෙක්
   2. ඇමතිවරයෙක්, මම, ඈ, අයෙක්
   3. ගැහැනියක, සෙබඩක්, ඇතමෙක්, මිනිස්සු
   4. යෙහෙළියෝ, වීරයකු, ළමයි, ශිල්පීහු

11. පෙරහැරේ උඩරට නැටුම් බලා අපි සතුටු වුණෙමු. මෙහි නැටුම් යනු
   1. තද්ධිත පදයකි   2. කෘදන්ත පදයකි
   3. පූර්ව ක්‍රියා පදයකි   4. සර්ව නාම පදයකි

12. උපසර්ග පද පමණක් යෙදී ඇති පද පෙළිය තෝරන්න.
   1. ළහිරු, සුපිරි, අපගමනය, අබිදම්
   2. විදෙස්, ඉම්හිරි, අලාමක, සුවහස්
   3. අසංවිධික, සුපසන්, විරූපී, නිවැරදි
   4. අවශේෂ, නිපුණ, අසංවිධිත, අධිභාරය

13. පිළිවෙළින් යංශය, රේපය, රකාරංශය, ගයනුකිත්ත යෙදුණු පද පෙළිය තෝරන්න.
   1. භාග්‍ය, විදර්ශනා, ගෞතම, ප්‍රාකාර
   2. අවශ්‍ය, ක්‍රෝධය, මාර්, චතුරශ්‍රය
   3. දුඃඛ, වර්ණ, ශ්‍රමය, මෞර්ය
   4. තුල්‍ය, ප්‍රදර්ශනය, ප්‍රවර්ධනය, මහෞෂධ

- අංක 14 සිට 16 තෙක් ප්‍රශ්නවල **තද කළු අකුරින්** මුද්‍රිත කොටසේ අර්ථය **නිවැරදි** ව දැක්වෙන වරණය තෝරන්න.

14. **විලිකුන්** සුරත් පල වැනි වේ රිවි මඬල
   1. ඉඳුණු   2. කුරුල්ලන්   3. කුරුළු පිහාටු   4. පැසුණු

15. ඔවුහු කාන්තාරයේ දින දෙකක් ම **ක්ෂුධාවෙන්** ගත කළහ.
   1. මහන්සියෙන්   2. පාළුවෙන්   3. පිපාසයෙන්   4. කුසගින්නෙන්

16. කවියාගේ **ප්‍රතිභාපූර්ණත්වය** උසස් නිර්මාණයක් බිහිවීමට හේතු වෙයි.
   1. අපූර්ව වස්තු නිර්මාණය කිරීමේ හැකියාව.
   2. උචිත අනුචිත දේ තෝරා බේරා ගැනීමේ හැකියාව.
   3. නිරතුරුව ම අභ්‍යාසයේ යෙදීම.
   4. අත්දැකීම් බහුල වීම.

17. '' යමක් සීමාව ඉක්මවා වර්ණනාවට හසු කිරීම'' යන්නට තනි පදයක් ලෙස යෙදිය හැක්කේ
   1. ස්වභාවෝක්තිය   2. අතිශයෝක්තිය
   3.ව්‍යුත්පත්තිය   4. බහුශ්‍රැත බව

18. මුලින් දී ඇති පදයට සමානාර්ථයක් නොදෙන පදයක් ඇතුළත් වරණය තෝරන්න.

1. චන්ද්‍රයා - සිසි, සොම්, සඳ, උළිඳු
2. ආහාර - අහර, ගොදුර, බොජුන්, භෝජන
3. ඉක්මන - නොලස, වහා, යුහු,
4. අරම - අසපුව, ආරාමය, කුටිය, ආශ්‍රමය

19. විරුද්ධාර්ථවත් පද යුගලක් නොවන වරණය තෝරන්න.

1. අනිවාර්ය - වෛකල්පික
2. ආමෝධය - දුර්ගන්ධය
3. ආගන්තුක - නේවාසික
4. බහුල - සුලබ

20. මුලින් දී ඇති ව්‍යාකරණ වර්ගයට **අයත් නොවන පදයක් සහිත** වරණය තෝරන්න.

1 කෘදන්ත - ලියවිලි, හිඟමන්, කැවිලි, නටන්නෝ
2. තද්ධිත - පහටි, සෙල්මවා, උත්සහාවන්ත, ත්‍යාගශීලී
3.නිත්‍ය බහු වචන - ඇතමෙක්, කෙනෙක්, අයෙක්, සමහරෙක්
4. සමූහාර්ථවාචී පද - ගවරැළ, කොඩි පෙළ, වන සතුන්, කුරුලු රෑන

21.පද සියල්ලෙහි ම විසන්ධි කිරීම නිවැරදි ව දැක්වෙන පද පේළිය තෝරන්න.

1. අති + අවශ්‍යය, ඇත් + දළ, උත්තම + ආචාර, දුක් + පත්
2. ඔවුන් + නොවුන්, නෙත් + අග, අත් + අම්මා, සුර + ඉඳු
3. සිති + අම්, කටු + අල, නියඟ + සාය, නළ + අඟන
4 තත් + පර, ළිඳ + වතුර, නිර් + අවුල්, වට + උර

22. පද දෙකෙහි ම අර්ථයක් නැති යුගල පදයක් සහිත වරණය තෝරන්න.

1. සට කපට, ගෙවල් දොරවල්, තාන්න මාන්න, මිල මුදල්
2. අඬා දොඩා, ළමා ළපටි, උසුළු විසුළු, වතු පිටි
3. වද හිංසා, හැළි වළං, ජර මර, අනං මනං
4. රණ්ඩු සරුවල්, අඟ හිඟ, ජය පැරදුම්, වත ගොත

23. මහාප්‍රාණාක්ෂරයක් යෙදී නැති වචනයක් සහිත පද පේළිය තෝරන්න.

1. සංඛ්‍යාව, සජ්ඣායනය, ප්‍රතිඵලය
2. සන්ධානය, විදේශාධාර, චන්ද්‍රග්‍රහණය
3. මේඝය, මධ්‍යාහ්නය, ගුඪවාදය
4. සන්ධාව, කනිෂ්ඨ, භූමිකාව

24. ප්‍රයෝජ්‍ය ක්‍රියාවක් යෙදී ඇති වාක්‍ය තෝරන්න.

1. ගුත්තිල ඇදුරුතුමා, වෙණ වයද්දී, සුරංගනාවෝ තාලයට නැටූහ.
2. ඔබ යතොත් මම ද යන්නෙමි.
3. ගුරුතුමා සිසුන් ලවා ගණන් සාදවයි.
4. ගොවියා මඩ සෝදා ගෙන ගෙදර ගියේ ය.

25. නිවැරදි අදහස සහිත වරණය තෝරන්න.

1. නිපාත, වාක්‍යවල මැද පමණක් යෙදී අර්ථය පැහැදිලි කරයි.
2. උපසර්ග පද යෙදෙන්නේ වචනවල මුලට පමණක් නො වේ.
3. ස්වර දෙකක් වෙනුවට වෙනත් ස්වරයක් ආදේශ වීමෙන් ස්වර සන්ධි සෑදේ.
4. අප්‍රාණවාචී බහු වචනවලට '' ඕ'' ''හු'' ප්‍රත්‍ය යෙදීමෙන් ප්‍රාණවාචී බහු වචන බවට පත්කර ගත හැකි ය.

26. ඌෂ්මාක්ෂර පමණක් ඇතුළත් වරණය තෝරන්න.

1. ෂ, ස, ළ,ව,ෆ
2. ශ, ෂ, ස, හ, ළ
3. ශ, ෂ, ස, ව, ළ
4. ශ, ෂ, ස, හ, ෆ

27. මූර්ධජ අක්ෂර පමණක් ඇතුළත් වරණය තෝරන්න.

1. ට, ඨ, ඩ, ණ,ළ
2. ණ, ළ, ඩ, ඪ, ත
3. ප, බ, ම, ණ, ළ
4. ෂ, ණ, ළ, බ, ප

- 28 සිට 30 තෙක් දී ඇති ප්‍රස්තාව පිරුළුවලට වඩාත් ගැළපෙන අදහස සහිත වරණය තෝරන්න.

28. අශ්වයාට අං ලැබුණා වාගේ

1. වටිනා කෙනෙකුට නොවටිනා දෙයක් ලැබීම.
2. නොවටිනා කෙනෙකුට වටිනා දෙයක් ලැබීම.
3. ඕනෑවට වඩා නිවට වීම.
4. ඕනෑවට වඩා උඩඟු වීම.

29. කල දුටු කල වළ ඉහගනු.
1. අවස්ථාව පැමිණි විට වැඩය කර ගත යුතු ය.
2. කාලයට අනුව වැඩ කිරීමට හුරු වන්න.
3. කාලය මැනවින් කළමනාකරණය කර වැඩ කරන්න.
4. කාලයට අනුව වැඩ කිරීම යහපත් ය.

30. ගොරවන තරමට වහින්නේ නැතිලු.
1. බොරු වීරකමක් පෙන්වීම.
2. කතාවේ තරමට ක්‍රියාව නැත.
3. පුද්ගලයා නරක ම නැත.
4. යමකින් ලැබෙන ප්‍රතිඵලය අඩු ය.

● 31 සිට 35 තෙක් ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍ය තෝරන්න.

31.
1. අපි විභාගයෙන් ජය ගනිති' යි ගුරුවරු සිතූහ.
2. අපි විභාගයෙන් ජය ගනිමු'යි ගුරුවරු සිතූහ.
3. අප විභාගයෙන් ජය ගනිති'යි ගුරුවරු සිතූහ.
4. අප විභාගයෙන් ජය ගනිමු'යි ගුරුවරු සිතූහ.

32.
1. ගෙවිලියන් දක්ෂ ගෘහිණියන් ද වූහ.
2. ගෙවිලියෝ දක්ෂ ගෘහිණියෝ ද වූහ.
3. ගෙවිලියෝ දක්ෂ ගෘහිණියන් ද වූහ.
4. ගෙවිලියන් දක්ෂ ගෘහිණියෝ ද වූහ.

33.
1. අපි කෞතුකාගාරය නරඹා ඇත.
2. පාසල් ක්‍රීඩා පිටියෙහි ළමයින් ඇත.
3. කිකිළියන් ආහාර සොයා යනු ඇත.
4. මම ඒ නාට්‍යයෙහි රඟපා ඇත.

34.
1. ගුරුවරු ළමයින් සමඟ සාකච්ඡා කළහ.
2. ගුරුවරුන් ළමයින් සමඟ සාකච්ඡා කළහ.
3. අම්මා නංගී කැටුව වෙළඳ පොළට ගියහ.
4. අම්මා ද නංගී ද වෙළෙඳ පොළට ගියා ය.

35.
1. අපි යහපත් දරුවන් සේ වැඩෙමු.
2. අප යහපත් දරුවන් සේ වැඩෙමු.
3. ඈ හොඳ මවක් ලෙස කටයුතු කළා ය.
4. මා ශිෂ්‍ය නායකයෙකු ලෙස කටයුතු කරමි.

36. අවධි විභක්තියට අයත් වන වාක්‍ය තෝරන්න.
1. මම පෑනෙන් අකුරු ලියමි.
2. අහසෙන් දිය බිඳු බිමට වැටෙයි.
3. අපි ගඟෙන් නෑවෙමු.
4. ගොවියෝ නඟුලෙන් සීසාති.

37. පහත සඳහන් පදයෙහි ඉරි ඇඳි පද අයත් වන විභක්ති වර්ග පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

හබලට ඔබේ සවිබල අත රිදෙනව ද
ඔරුකඳ උඩින් දළ රළ පෙළ නඟිනව ද
සීතල සුළං රළුවට ඇඟ වැදෙනව ද
හිමියනි වෙහෙස නිදිමත දෙක දැනෙනව ද

1. සම්බන්ධ, ප්‍රථමා, කර්ම, ආලපන
2. සම්බන්ධ, කර්ම, ප්‍රථමා, ආලපන
3. සම්ප්‍රදාන, ප්‍රථමා, කර්ම, ආලපන
4. සම්ප්‍රදාන, කර්ම, ප්‍රථමා , ආලපන

38. ප්‍රාදේශික උප භාෂා අනුව මුලින් දී ඇති පොදු වහර හා ගැළපෙන වරණය තෝරන්න.
හට්ටි - අප්පල්ලේ
2. මහලු කත - මෝවි
රණ්ඩුව - සුම්බරේ
4. කුඩා නිවස - මඩම්

39. උපමාවක් නොයෙදෙන කවි පාදය තෝරන්න.
1. "සැලෙන පහන් සිළ වැනි රඟන ලිය සැදී"
2. " විදෙන ලෙලෙන නරු බර පුළුලුකුල රැඳී "
3. රන් රසේ එක් වන ලෙසේ වෙණ නාදනු පා තබ තබා "
4. නිසි පුළුලුකුල රිය සක සුරු තිසර තන"



40. "එම්බල පුරුෂය තා කෙරෙහි මම සැක ඇත්තෙමි" මේම පාඨය උපුටා ගන්නා ලද්දේ
1. සද්ධර්ම රත්නාකරය
2. පන්සිය පනස් ජාතක පොත
3. රාජාවලිය
4. පූජාවලිය

**කැලණිය අධ්‍යාපන කලාපය**

**දෙවන වාර පරීක්ෂණය - 2016**

**සිංහල භාෂාව හා සාහිත්‍යය - II පත්‍රය**

**11 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

❖ **ප්‍රශ්න සියල්ලට ම උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු 80කි.**

1.(i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටස්වලට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) පහත සඳහන් පදවල අරුත් පැහැදිලි වන සේ වාක්‍ය දෙකක් ලියන්න.

(අ) නල (ආ) නළ

(ii) පහත සඳහන් වාක්‍යයෙහි ඇතුළත් උපසර්ග පද දෙකක් උපුටා දක්වන්න.
ළමා අපයෝජනයට ප්‍රධාන හේතුව වන්නේ වැඩිහිටියන්ගේ නොසැලකිල්ල බව උගතුන්ගේ මතයයි.
(අ) (ආ)

(iii) පහත සඳහන් (අ) (ආ) යටතේ දැක්වෙන අදහස්වලට තනි පදයක් ලියන්න.

(අ) පරපුරෙන් ලැබෙන අයිතිය (ආ) යකඩින් කරන ලද

(iv) පහත දැක්වෙන (අ) සහ (ආ) යෙදුම්වල පළමු වචනය හා දෙවන වචනය අතර නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන සේ පළමු වචනය හෝ දෙවන වචනය සකස් කර ලියන්න.

(අ) දක්ෂිණ පෙදෙස (ආ) ඇමති මණ්ඩලය

(v) පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.

බලශක්ති අර්බුධයට නිසි පිළියම් යෙදීමට විකල්ප බලශක්ති පිළිබඳ ගවේශන කටයුතු ආරම්භ වූයේ බොහෝ කලකට පෙර සිට ය.

(අ) (ආ)

(vi) පහත සඳහන් වාක්‍ය ඒවා නිදොස් කර නැවත ලියන්න.

(අ) අනුනායක හිමියෝ බණ දේශනා කරති'යි අපි සිතුවෙමු.
(ආ) ඌරන් විසින් අපේ හේන විනාශ කරනු ලැබූහ.

(vii) පහත සඳහන් වාක්‍ය ඛණ්ඩවල තද කළු අකුරින් මුද්‍රිත පද අයත් වන ක්‍රියා වර්ගය නම් කරන්න.
(අ) '' **කියත** උන් මෙතෙපල - ආයේය ඇඳුරු ගුත්තිල''
(ආ) ''**කරව** පියාසර සකි කොන්තගංතොටින්''

(viii) පහත දැක්වෙන සන්ධි පද අයත් වන සන්ධි වර්ගය නම් කරන්න.
(අ) සහෝදර - (ආ) බලැති -

(ix) පහත සඳහන් වාක්‍යවල **තද කළු අකුරින් මුද්‍රිත** පද අයත් විභක්ති වර්ගය නම් කරන්න.

(අ) ඈ **රූප සම්පත්තියෙන්** අගතැන් ගත්තා ය.

(ආ) **අක්කාගේ** මාලයේ මුතු කැට දිලිසෙයි.

(x) පහත සඳහන් වාක්‍යයෙහි **තද කළු අකුරින්** මුද්‍රිත පදවල තේරුම් ලියන්න.

**පරිණාමවාදයේ** පියා ලෙස සැලකෙන චාල්ස් ඩාවින්ගේ මතයට සමස්ත ලෝකයා ම **සම්මුතියකට** එළඹුනහ.

(අ) (ආ)

(ලකුණු 02 x 10 - 20)

2. පහත දැක්වෙන (අ) (ආ) (ඉ) (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරා ගෙන වචන 250 කට නොඅඩු රචනයක් ලියන්න. ඒ සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

★ අන්තර්ගත විය යුතු කරුණු
★ ඡේද සංඛ්‍යාව
★ කරුණු පෙළ ගැස්වීමේ දී අනුගමනය කළ හැකි ක්‍රියා පිළිවෙළ
★ යොදා ගත හැකි මාතෘකාව ආදිය පිළිබඳ මග පෙන්වීමක් අදාළ විස්තරය ඇසුරෙන් ලබා ගන්න.

(අ) ශ්‍රී ලංකාව යහපත් වූ භෞතික හා දේශගුණික අංගවලින් සපිරි සුන්දර රටක් විය. ජනගහනය අධික වීම, ඉදිකිරීම් ක්ෂෙත්‍රය පුළුල්වීම, නගර නිර්මාණය, අනිසි මානව ක්‍රියාකාරකම් ආදී කරුණු නිසා පාරිසරික ගැටලු රාශියකට මුහුණදීමට සිදු ව ඇත. පරිසර ආපදා නිසි ලෙස කළමණාකරණය කිරීම අත්‍යවශ්‍ය කරුණකි. රජය මේ වෙනුවෙන් වගකීමෙන් බැඳී සිටින අතර මහජනතාවට ද ඒ පිළිබඳ වගකීමක් පැවරී ඇත. එසේ කිරීමෙන් පරිසරය, ජීවිත හා දේපළ හානි වළක්වා ගත හැකි ය.

(ආ) ඉන්දියන් සාගරයේ මුතු ඇටය නමින් විරුදාවලි ලැබූ අප රට සුන්දර දිවයිනකි. රට වටා පිහිටි නොගැඹුරු වූ සුන්දර මුහුදු තීරයත් රට මැද පිහිටි සුන්දර කඳුකරයත් දෙස් විදෙස් සංචාරකයින්ගේ සිත් ඇද බැඳ ගනී. සංචාරක කර්මාන්තයෙන් අප රටට දායාද වන විදේශ විනිමය රටට ධන උල්පතකි. එහෙත් ඒ හරහා පැමිණි ළමා අපයෝජනය, මත් කුඩු උවදුර ආදී ගැටලු අප රටට අභාග්‍ය උදාකළ බව ද නොරහසකි. නිසි ලෙස සංචාරක කර්මාන්තය පවත්වා ගැනීම අප කාගේත් වගකීමකි.

(ඉ) ගීතය, සංගීතය සමඟ ඇත්තේ අපූරු සම්බන්ධතාවයකි. මිනිසාගේ වින්දනය හා චින්තනය අවදි කිරීමට මෙම කලා මාධ්‍යයෙන් ලැබෙන පිටුබලය අතිමහත් ය. මෙහිදී සම්භාව්‍ය ගීතය හා සංගීතය මිනිසාගේ මනස හා බුද්ධිය අවදි කරමින් ඔවුන්ට මහත් ආස්වාදයක් ගෙන දෙයි. ඉන් සිදුවන පුද්ගල සංවර්ධනයෙන් යහපත් සමාජයක් බිහිවෙයි. එහෙත් වර්තමානයේ පවතින අවර ගණයේ ගීත හා සංගීතය එසේ කරන්නේදැ' යි යන්න ගැටලුවකි. මෙම කරුණු යහපත් සමාජයක් බිහිකිරීමට මග බැවින් උසස් වින්දනයක් සඳහා කලාව මෙහෙයවිය යුතු ය.

(ඊ) එදා ඉරිදා දිනයක් වූ හෙයින් උපුල් හා ඔහුගේ මිතුරන්ට අපූරු අදහසක් පහළ විය.ඒ ඔවුනගේ ගම අසල තිබූ මාදු ගඟේ දූපත් බැලීමට යාමයි. සියලු දෙනා ගමනට සූදානම් වූයේ මහත් සතුටිනි. කෑම බීම රැගෙන බෝට්ටුවට නැගී ගමන ආරම්භ කළහ. ඔවුන්ගේ ඉල්ලීම පිට ම වෙනත් අය නොයන දූපතකට ඔවුන්ට යාමට බෝට්ටුකරුවා එකඟ කර ගත හැකි විය. මහත් කුතුහලයෙන් ඔවුහු දූපතට ඇතුළු වූහ. එය අභිරහස් දූපතක් දැ'යි ඔවීන්ට හැඟුණි.

( ලකුණු 25 )

3. පහත සඳහන් ඡේදය වචන 50 - 60 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදු වචන සංඛ්‍යාව ද සාරාංශය අග ලියන්න.

විවිධ වර්ගයේ රසායනික පරිරක්ෂක දශක ගණනාවක් තිස්සේ භාවිත කර තිබුණ ද ඒවායේ බලපෑම හෙළිදරව් වී ඇත්තේ මද වශයෙනි. විය හැකි බලපෑම් තෙවදෑරුම් වේ. ඒ සෙල පටලයේ හා සෙල බිත්තියේ පාරගම්‍යතාවයට බාධා පැමිණවීම, ජාන ක්‍රියා කරනු ලබන පිළිවෙළට බාධා පැමිණ වීම, හා සෙල තුළ එන්සයිම ක්‍රියාකාරීත්වයට බාධා පැමිණවීම වශයෙනි. ආහාරවලට එකතු කරන වර්ණක විශාල සංඛ්‍යාවක් ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් පරීක්ෂා කර ඇති අතර ඉන් සැලකිය යුතු සංඛ්‍යාවක් අනාරක්ෂිත බව ප්‍රකාශයට පත් කර ඇත. වියළන ලද පලතුරු හා එළවළුවල වර්ණය රැකදීමට හා වයින් වැනි පැසවීම් මඟින් සකස් කරන ආහාර මත ක්ෂුද්‍ර ජීවීන් වර්ධනය වීම වළක්වාලීමට සල්ෆයිට කාරක එකතු කරනු ලැබේ. ජනගහනයෙන් සුළු ප්‍රමාණයකට මෙම පරිරක්ෂකය එක් කළ ආහාර ගැනීමෙන් පසු ක්ෂණික ව ශ්වසන අපහසුතා ද ඇතැම් විට මාරාන්තික තත්ත්ව වුවද ඇති විය හැකි ය. ඇදුම රෝගීන්ට එමඟින් දරුණු ඇදුම තත්ත්වයන් ඇති විය හැකි ය. එබැවින් සල්ෆයිට එකතු කරන ලද ඇසුරුම් කළ හෝ සකස් කළ ආහාර ද්‍රව්‍ය ලේබල මත ඒ බව සඳහන් කර තැබීම අනිවාර්ය වේ.

4. පහත සඳහන් ජේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට උත්තර ලියන්න.

සන්නිවේදනය යනු මිනිසාගේ අදහස් ප්‍රකාශනයේ ක්‍රමවේදයකි. නිර්මාණාත්මක සන්නිවේදනය යනු කිසියම් සන්දේශයක් කිසියම් මාධ්‍යයක් ඔස්සේ වඩාත් අපූර්වත්වයකින් යුතු ව ඉදිරිපත් කිරීමයි. ශ්‍රව්‍ය, දෘශ්‍ය, ලිඛිත යන සන්නිවේදන ක්‍රමයන්ගේ වර්ධනයත් සමඟ ජන මාධ්‍ය භාවිතය පිළිබඳ ව යම් යම් විධි ක්‍රමයන් ද ඇති වූ බව මානව ඉතිහාසය තුළින් පැහැදිලි වේ. එහිදී ඒවා අපූර්වත්වයකින් යුතු ව ඉදිරිපත් කිරීමත්, ග්‍රාහකයාගේ අවධානයට හසුකිරීමත් මූලික අපේක්ෂාව විය. නිර්මාණශීලී ගුණය සඳහා යහපත් ප්‍රතිචාර ලබා ගැනීම හා සාර්ථක ව යම් අර්ථ සිද්ධියක් ළඟා කර ගැනීම අපේක්ෂාව වේ. සමහරු එය සමාජීය අවශ්‍යතාවක් මුදුන්පත් කර ගැනීමක් ලෙසට ද හඳුන්වති. එසේ ම ඒ තුළින් අන්‍යයන්ට යමක් වටහා ගැනීමේ හැකියාව ද ඇති වී තිබේ. මෙම නිර්මාණාත්මක රීතිය සන්නිවේදනයේ දී සාර සන්නිවේදනය යනුවෙන් හඳුන්වනු ලැබේ.

නිර්මාණාත්මක සන්නිවේදනයේ දී සාම්ප්‍රදායික හා නූතන සන්දේශ සාහිත්‍ය, මූර්ති, චිත්‍ර, කැටයම් හෝ නාට්‍ය යනාදිය නවතාවකින් යුතු ව ඉදිරිපත් කිරීමට කටයුතු කරයි. එබැවින් නිර්මාණාත්මක සන්නිවේදනය තුළ දී කිසියම් දෙයක් මැවීම, අලුත් යමක් ගොඩනැගීම, නවතාවයකින් යමක් ඉදිරිපත් කිරීම දක්නට ලැබේ. යම් නිර්මාණ ශිල්පියෙක් කිසියම් නිර්මාණයක් බිහි කරන්නේ තම හදවත සියුම් ලෙස සසල කළ අත්දැකීමක් අන්‍යයන්ට ප්‍රකාශ කිරීම සඳහා ය. ඒ තුළින් තමා ලත් කම්පනය අන්‍යයන්ට ද දැනවීම ඔහුගේ පරමාර්ථය වේ.

1. නිර්මාණාත්මක සන්නිවේදනය යනු කුමක් ද ?
2. ජන මාධ්‍ය භාවිතයේ දී ඒවා ප්‍රචලිත කිරීමට ඇති කර ගත් විධි ක්‍රම දෙකක් දක්වන්න.
3. සන්නිවේදනයේ දී නිර්මාණාත්මක රීතිය හඳුන්වන්නේ කුමන නමකින් ද ?
4. නිර්මාණාත්මක සන්නිවේදනයේ ලක්ෂණ දෙකක් ලියන්න.
5. නිර්මාණාත්මක ශිල්පියෙකුගේ ප්‍රධාන පරමාර්ථයක් ලෙස මෙහි හඳුන්වන්නේ කුමක් ද ?

(ලකුණු 02 x 05 - 10)

5. පසුගියදා ඇද හැළුණු ධාරාණිපාත වර්ෂාව නිසා මීවැල්ල ප්‍රදේශයේ ජීවත් වූ පවුල් 22 ක් අවතැන් ව ඇත. ඔවුන්ගේ නිවාස නැවත පිළිසකර කර දීමට අවශ්‍ය ව ඇත. ප්‍රදේශයේ ප්‍රජා මණ්ඩලයේ ලේකම් ජයදේව රත්නවීර ඔබ යැයි සිතා මේ සඳහා ආධාර මුදල් ලබා ගැනීමට ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයා වෙත යැවෙන ලිපිය සකස් කරන්න. ( වචන 100 ක් පමණ සෑහේ)

( ලකුණු 15 )

නැතහොත්

ජයගම මධ්‍ය මහා විද්‍යාලයේ විද්‍යාල දිනය වෙනුවෙන් පැවැත්වෙන සංස්කෘතික උත්සවය 2016 - 09 - 10 වන දින විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේ දී එදින පෙ.ව. 9.00 සිට 1.00 දක්වා පැවැත්වීමට නියමිත ය. එදින වැඩ සටහන සඳහා කලා සංගමය මඟින් සැකසෙන න්‍යාය පත්‍රය සකස් කරන්න. (වචන 100 ක් පමණ සෑහේ)

( ලකුණු 15 )

කැලණිය අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2016

සිංහල භාෂාව හා සාහිත්‍ය - III පත්‍රය

11 ශ්‍රේණිය | කාලය පැය 02 යි.

- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් උත්තර සපයන්න.
- 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් උත්තර සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

1. (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) '' වහා නුවරට වැද ගැල් පුරා ගෙන'වුත් කොමඩු බානා සේ මහා ජනයා ඉස් කපා ගනුව''

(අ) මෙම ප්‍රකාශය කරනු ලැබුවේ කවුරුන් විසින් ද ?

(ආ) මෙහි සඳහන් වන මහා ජනතාව අයත් රාජ්‍ය කුමක් ද ?

(ii) '' පුත තෙල ලෙස කිරීම තොපටත් අපටත් තරම් නොවෙයි''

(අ) පුත යනුවෙන් මෙහි සඳහන් වන පුද්ගලයා කවරෙක් ද ?

(ආ) මෙම පාඨය උපුටා ගත් කෘතිය රචනා කරනු ලැබුවේ කවුරුන් විසින් ද ?

(iii) '' මා සමඟ යන්නට කැමැත්තහු නම් මාගේ අධිෂ්ඨානය මුදුන්පත් වේ.''

(අ) මෙම ප්‍රකාශය කා හට කියන ලද්දක් ද ?

(ආ) මෙම පාඨය උපුටා ගත් කෘතිය නම් කරන්න.

(iv) ''මිනිහා අනුමානයක් නෑ මැරෙන්ඩ ඇති''

(අ) මැරෙන්ඩ ඇතැයි සැලකෙන පුද්ගලයාගේ නම ලියන්න.

(ආ) මෙම ප්‍රකාශය කවුරුන් විසින් කරන ලද්දක් ද ?

(v) (අ) '' ළමා කවි කලඹ'' යන කෘතියෙහි කතුවරයාගේ නම ලියන්න.

(ආ) ''රන්තරු පිරිවරා ගත් සඳ මඬල යට''

මෙම පද්‍ය පාදය සඳහන් පද්‍ය පන්තිය කවුරුන් විසින් රචනා කරන ලද්දක් ද?

(vi) '' ඇපි අන්නට හිංසා නොකරන කුලෙහි උපන්නම්හ''

(අ) මෙම පාඨය උපුටා ගන්නා ලද කෘතිය ලියවුණු යුගය කුමක් ද ?

(ආ) මෙම ප්‍රකාශය කළ තැනැත්තා එසේ කීමට හේතුව කුමක් ද ?

(vii) '' දිමුත් වෙහෙර වට විසිතුරු මල් වතුය''

(අ) මෙම පද්‍ය පාදය සඳහන් කාව්‍ය ග්‍රන්ථය රචනා කරනු ලැබුවේ කවුරුන් විසින් ද ?

(ආ) එම කතුවරයා විසින් රචනා කරන ලද වෙනත් කෘතියක් සඳහන් කරන්න.

(viii) ''නිමල් සඳ පහන් වැනි වැලි පිට උදුළ''

(අ) මෙම පද්‍ය පාදය උපුටා ගන්නා ලද කෘතිය නම් කරන්න.

(ආ) එම කෘතිය ලියවුණු යුගය සඳහන් කරන්න.

(ix) එල්ල වෙන්ට කවි කර කීවෙමි බොහොම
කොල්ල කන්ට එකී සිවුපාවෝ බොහොම
ගොල්ල සමඟ එති ඌරෝ හැමදාම
..............................................................

(අ) මෙම පද්‍යයේ ඉතිරි කවි පාදය සම්පූර්ණ කරන්න.
(ආ) මෙම ජන කවිය අයත් වන ජන කවි ප්‍රභේදය කුමක් ද ?

(x) ''ජයෙහි ලොබ බැන්දේ
මා වීණා තත ද සින්දේ ''
(අ) මෙහි වීණා තත සිඳුණු ලැබුවේ කවුරුන් විසින් ද ?
(ආ) මෙම පද්‍ය සඳහන් මුල් කෘතිය රචනා කරනු ලැබුවේ කවුරුන් විසින් ද ?

(ලකුණු 02 x 10 - 20 )

2. පහත සඳහන් ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

(අ) වලදින අදහසින් මෙන් සුර ගඟ අඟන
නල බල සසල දළ රළ පෙළ නුබ නැගෙන
වෙලළස ගැවැසි මුතු සක් පබළු බබලන
බල මහ මුහුද එම සඳැ උතුරින් පෙනෙන

(අ) මෙහි සඳහන් උපමාව, උපමේය වෙන් කොට ලියන්න.
(ආ) සුර ගඟ, සඳැ යන වචනවල තේරුම් ලියන්න.

(ආ) නිබඳ පැසී පල ලඹ දෙන මිහිර’ඹය
සුවඳ විහිද සිටි විලිකුන් කැන් රඹය

(අ) මිහිර’ඹ යන පදය විසන්ධි කරන්න.
(ආ) රඹ, විලිකුන් යන පදවල අර්ථ දක්වන්න.

(ඉ) අමුතු බත් දීම අත ඇල්ලුමෙන් දැනේ
හානා හීය පානා අඬ හැරෙන් දැනේ

(අ) අමුතු බත් දීම යන්න පැහැදිලි කරන්න.
(ආ) හීය, අඬ හැරෙන් යන පදවල තේරුම් ලියන්න.

(ඊ) '' රජ එකල්හි 'කිමෙක් වෙ' ? යි පුළුවුත්තෙන් සොරෙක් වෙයි හො ? යි කී යැ''
(අ) පුළුවුත්තේන්, හො යන පදවල තේරුම් ලියන්න.
(ආ) මෙහි සඳහන් රජුගේ නම ලියන්න.

(උ) මා දන්නා ශිල්පත් උගත් හෙයින් මුත් සයං සිද්ධ නොවන්නේ වේ ද? ඇගේ ඒ බෑවුම් පලවා මමත් ශිල්ප උගනිමි.
(අ) සයං සිද්ධ, බෑවුම් පලවා යන පදවල තේරුම ලියන්න.
(ආ) මෙහි ඇය යනුවෙන් අදහස් වන අයගේ පවතින දුර්ගුණය කුමක් ද?

● 3, 4 යන ප්‍රශ්නවලට වචන 150 - 200 අතර විය යුතු ය.

3. උග්ගසේන වස්තුවෙහි එන උග්ගසේන සිටු පුත්‍රයාගේ
(i) අධිෂ්ඨානශීලී බවත්,
(ii) අභියෝගවලට නොසැලී මුහුණ දීමත්
යන ගුණාංග වර්තමාන පුද්ගල ජීවිතයට ද මහඟු ආදර්ශ සපයයි. එක් කරුණකට උදාහරණ දෙක බැගින් ගෙන පැහැදිලි කරන්න.

(ලකුණු 15)

නැතහොත්

කිසියම් සිද්ධියක් හෝ අවස්ථාවක් රසවත් ව නිරූපණය කිරීමට අඟුල්මල් දමනය කතුවරයා යොදා ගත්
(i) කෙටි වැකි භාවිතය
(ii) අනුප්‍රාසවත් යෙදුම් භාවිතය කොතෙක් දුරට ඉවහල් වී ඇත්' දැයි එක් කරුණකට උදාහරණ දෙක බැගින් ගෙන විමසන්න.

(ලකුණු 15)

4. කෑරගල ගම් පියස
(i) සුන්දර බවින් ද
(ii) ඉසුරුමත් බවින් ද
අනූන වූ ප්‍රදේශයක් බව වර්ණනා කිරීමට කතු හිමියන් ගත් උත්සාහය කොතෙක් දුරට සාර්ථක වී ඇත්දැ'යි එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15)

නැතහොත්

(i) ගංගාව සෞන්දර්යයෙන් අනූන වස්තුවක් ලෙස ද
(ii) මනුෂ්‍ය ජීවිතයේ ස්වාභාවය නිරූපණය කරන්නක් ලෙස ද
සිතුවම් කිරීමට කතුවරයා ගත් උත්සාහය සාර්ථක වී ඇත. එක් කරුණකට උදාහරණ දෙක බැගින් ගෙන ගංගාවේ සංගීතය පද්‍ය පන්තිය ඇසුරින් ඉහත කියමන සනාථ කරන්න.

(ලකුණු 15)

● 5, 6, 7 ප්‍රශ්නවලින් **එකකට** උත්තර සපයන්න. වචන 125 - 150 අතර විය යුතු ය.

5. හේන් ගොවිතැනේ දී ගොවියාට මුහුණ දීමට වන අභියෝග පාදක කර ගනිමින් රසවත් ජන කවි ලියවී ඇති ආකාරය '' කුරහන් ඉසිමුව කළුවර බලලා'' යන පද්‍ය පන්තියෙහි ඇතුළත් උදාහරණ **තුනක්** මඟින් පෙන්වා දෙන්න.

(ලකුණු 10)

6. “මිනිස් හා සත්ත්ව සමූහයාගේ විලාශයෙන් කියා පෑවේ ගුත්තිල පඬිතුමාගේ වීණා වාදනටයහි ආශ්චර්යයයි” ගුත්තිල කාව්‍යයෙහි එන අවස්ථා තුනක් ඇසුරින් ඉහත කියමන සනාථ කරන්න.

(ලකුණු 10)

7. පියකු විසින් ඉටු කළ යුතු යුතුකම් මනා සේ ඉටු කරන පියකු ලෙස 'සිංහබාහු' නාට්‍යයෙහි එන “සිංහයා” චරිතය දැක්විය හැකි ය. උදාහරණ **තුනක්** මඟින් මේ කියමන පැහැදිලි කරන්න.

(ලකුණු 10)